# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2356/35 – 2023 නොවැම්බර් 03 වැනි සිකුරාදා – 2023.11.03**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/Q/2014/119.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.03.15 දිනැති හා අංක 1958/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.03.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පොල්ගස්ඕවිට, හල්පිට, රණවිරු මාවත, අංක 128/26/2 (වර්තමාන ලිපිනය - කහතුඩුව, ප්‍රගති මාවත, සිතුමිණ උයන පාර, පළමුවන පටුමග, අංක 381/ඒ/17) හි පදිංචි බී. ඩී. ගුණවර්ධන මයා සහ ගාල්ල, පහළ ඩික්සන් පාර, අංක 19 හි පිහිටි දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 3634 හා 2023.10.04 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

නඩු අංකය: A - 3634
යොමු අංකය: IR/COM/04/Q/2014/119

බී. ඩී. ගුණවර්ධන මයා,
අංක 128/26/2,
රණවිරු මාවත, හල්පිට,
පොල්ගස්ඕවිට.

*පළමු පාර්ශ්වය*

සහ

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,
අංක 19,
පහළ ඩික්සන් පාර,
ගාල්ල.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව, උක්ත ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2016.03.10 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරාවුලට තුඩුදුන් කාරණය

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගතවී ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය ලෙස දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවරයකු ලෙස සේවය කළ බී. ඩී. ගුණවර්ධන මහතා, 1999.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉංජිනේරු IV වන ශ්‍රේණිය සහ 2003.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉංජිනේරු III ශ්‍රේණිය ලබාගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත වන්නේ ද යන්න සහ එසේ යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳවයි.

**පසුබිම**

පැමිණිලිකරු විසින් වර්ෂ 2016 ක් වූ මාර්තු මස 28 වන දින මුල් පැමිණිල්ල ඉදිරිපත් කළ අතර වගඋත්තරකරු විසින් 2016.04.29 වන දින පිළිතුරු ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත. 2016.05.30 වන දින පැමිණිලිකරු විසින් කාර්මික අධිකරණය වෙත ලිපියක් යොමු කරමින් 2016.05.09 දාතමින් යුතු ප්‍රතිවිරෝධතාවය ඉල්ලා අස්කර ගනිමින් 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 36(1) (ඈ) වගන්තිය ප්‍රකාරව ප්‍රතිවිරෝධතා ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටින ලදී.

වර්ෂ 2016.05.30 වන දින මුල් වරට විමසීමට ගත් අවස්ථාවේදී විධිමත් විරෝධතා ප්‍රකාශයක් 2016.07.12 වන දිනට පෙර වගඋත්තරකරුට දැන්වීම් සහිතව ඉල්ලුම්කරු විසින් 2016.06.11 වන දින සහ 2016.07.08 වන දින අදාළ ලේඛන ලබාදෙන ලෙස ඉල්ලා සිටිය ද එය නොලැබුන බවට දන්වන ලදී. 2016.11.07 වන දින ඉල්ලුම්කරු විසින් සංශෝධිත සංවිස්තර ප්‍රකාශයක් කාර්මික අධිකරණය වෙත යොමු කරන ලදී.

ඉල්ලුම්කරු විසින් X1 සහ X2 වශයෙන් ලේඛන 02 ක් ද ඉදිරිපත් කරන ලදී. වගඋත්තරකරුවන් වෙනුවෙන් ලිපියක් ඉදිරිපත් කරමින් 2016.12.05 දිනට විස්තර ප්‍රකාශය ඉදිරිපත් කිරීමට කාලය ප්‍රමාණවත් නොවන බව දන්වා වෙනත් දිනයක් ලබාදෙන ලෙස අයැද සිටින ලදී. දෙපාර්ශ්වයටම 2017.01.27 වන දිනට ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලදී. 2017.02.01 වන දින වගඋත්තර පාර්ශ්වයේ දෙවන ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී.

2017 ක් වූ පෙබරවාරි මස 14 වන දින ඉල්ලුම්කාර පක්ෂය ප්‍රති සැළකිරීම් ඉදිරිපත් කරන ලදී. වර්ෂ 2017 ක් වූ මාර්තු 16 වන දින විමසීමට ගත් අවස්ථාවේ දී වගඋත්තරකාර පාර්ශ්වය කාලාවරෝධී ආඥාව පනත යටතේ මෙම නඩුව කාලාපගමනය වී ඇති බවට විරුද්ධතාවයක් දක්වන ලදී. මේ අවස්ථාවේදී දෙපාර්ශ්වයටම ලිඛිත කරුණු ඉදිරිපත් කිරීමට අවසර ලබා දුනි.

පළමු පාර්ශ්වය 2017.03.31 වන දින දී ද, වගඋත්තරකාර පාර්ශ්වය 2017.04.06 වන දින දී ද ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කරන ලදී. 2017.11.23 වන දින මවිසින් නියෝගයක් නිකුත් කරමින් මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරමින් ආරාවුල ඉදිරියටත් බේරුම්කරණය සඳහා පවත්වා ගෙන යාමට නෛතික බාධාවක් නොමැති බවට නියෝග කරන ලදී.

වර්ෂ 2018 ක් වූ මාර්තු මස 28 වන දින මූලික සාක්ෂි විභාගය අරඹන ලදී. පසුව දෙපාර්ශ්වයේ ඉල්ලීම මත නඩු විභාගය 2018.05.30 වන දිනට දීර්ඝ කරන ලදී. 2018.08.26 වන දින ඉල්ලුම්කරු මූලික සාක්ෂි දෙමින් A1 සිට A12 දක්වා ලකුණු කරමින් මූලික සාක්ෂි අවසන් කරන ලදී. හරස් ප්‍රශ්න සඳහා 2018.09.13 සහ 2018.10.04 දක්වා යොමු කරන ලදී. 2018.09.13 වන දින ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන ලදී. එදින ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න ඇසීම අවසන් වූ අතර දැනට නියම කර ඇති පරිදි නැවත ප්‍රශ්න ඇසීම 2018.10.04 වන දිනට ඊට අමතරව 2018.11.28 වන දිනට නියම කරන ලදී.

නැවත ප්‍රශ්න 2019 ක් වූ ජුනි මස 10 වන දින අරඹා A1 සිට A12 දක්වා ලේඛන ලකුණු කරමින් පළමු පාර්ශ්වයේ නඩුව අවසන් කරන ලදී. දෙපාර්ශ්වයේ එකඟත්වය මත 2019.08.06 වන දින නඩුව විභාගයට නියම කළ ද වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂි මෙහෙයවීම 2019.09.12 වන දින මූලික සාක්ෂි ආරම්භ කරන ලදී. වැඩිදුර මූලික සාක්ෂි සඳහා 2019.10.26 වන දිනට නියම කරන ලදී. 2019.10.26 වන දින වගඋත්තරකරුවන් වෙනුවෙන් වැඩිදුර මූලික සාක්ෂි මෙහෙයවන අතර දැනට ඉල්ලුම්කරු විශ්‍රාම ගොස් ඇති බැවින් මූලික විරෝධතාවයක් මතු කරමින් සේව්‍ය සේවක සම්බන්ධතාවය නොමැති බවත් රොබින්සන් ප්‍රනාන්දුට එරෙහිව හෙන්රියාටා ප්‍රනාන්දු ඉන්දියානු රාජ්‍ය බැංකුවට එරෙහිව සුන්දරලිංගම් නඩු තීන්දුව ද දක්වමින් බේරුම්කරණයට මෙම නඩුව විසඳීමට අධිකරණ බලයක් නොමැති බවට විරෝධතා මතු කරන ලදී.

ඉල්ලුම්කාර පක්ෂය මෙම ප්‍රශ්නයට ලිඛිත කරුණු දැක්වීමට අවසර පතන ලදී. දෙපාර්ශ්වය විසින්ම ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කරන ලද අතර මෙම විරෝධතාවය හදිසියේ පැන නැගුණු අවස්ථාවක් නොව මුල සිට පැවති අවස්ථාවක් වන බැවින් ද ඉල්ලුම්කරුගේ නඩුව අවසාන වී වගඋත්තරකරුවන් ද සාක්ෂි මෙහෙයවීම අරඹා ඇති හෙයින් විරෝධතාවය සම්බන්ධයෙන් නඩුව අවසානයේදී සළකා බලන බැව් දන්වන ලදී.

2020.07.22 වන දින වගඋත්තරකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ කළ ද වැඩිදුර හරස් ප්‍රශ්න සඳහා දිනයක් අයැද සිටි හෙයින් 2020.09.18 වන දිනට නියම කරන ලදී. පසුව 2021.01.13 වන දින කැඳවන ලද අවස්ථාවේදී ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජනයක් තිබුණ ද වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ නියෝජනයක් නොවුණි. 2021.03.03 වන දිනට අවසාන වශයෙන් වගඋත්තරකාර පාර්ශ්වයට දිනයක් ලබා දුනි. 2022.02.17 වන දින විභාගයට ගත් අවස්ථාවේදී වගඋත්තරකාරයන් වෙනුවෙන් දන්වා සිටියේ වගඋත්තරකරුවන්ගේ පළමු සාක්ෂිකරු මේ වන විට විශ්‍රාම ගොස් ඇති බවත් වෙනත් සාක්ෂිකරුවෙකු ඉදිරිපත් කිරීමට දිනයක් අපේක්ෂා කරන බවත්ය.

ඉල්ලුම්කරු ප්‍රථම වතාවට බේරුම්කරණය ඉදිරියේදී 2018.03.28 වන දින මූලික සාක්ෂි ආරම්භ කරමින් මහාමාර්ග දෙපාර්තමේන්තුවේ පත්වීම සම්බන්ධයෙන් ප්‍රකාශ කළ අවස්ථාවේදී වගඋත්තරකාර පක්ෂය පත්වීම සම්බන්ධයෙන් හබ නොකරන බව දන්වන ලදී. මේ අවස්ථාවේදී වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි රජයේ අධිනීතිඥ සූර්යකුමාර මහත්මිය ප්‍රකාශ කරන ලද්දේ නීතිපති දෙපාර්තමේන්තුවේ වෙනත් නීතිඥවරයෙකුගේ සහය ලබා ගත හැකි බවත්ය.

2018.08.06 වන දින ඉල්ලුම්කරු මූලික සාක්ෂිය දෙමින් 1986 ගාල්ලේ ලැබූ පත්වීමට අදාළ ලේඛනය A1 වශයෙන් ද පළාත් රාජ්‍ය සේවයට පත්වීමේ ලිපිය A2 වශයෙන් ද දකුණු පළාත් සභාවට අන්තර් ග්‍රහණයකොට කාර්මික නිලධාරි VI වන ශ්‍රේණියට පත් කරන ලද ලේඛනය A3 වශයෙන් ද 1994.01.17 වන දින 1993.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි V වන ශ්‍රේණියට පත් කරන ලද ලිපියේ A4 වශයෙන් ද ලකුණු කරන ලදී. V වන ශ්‍රේණියේ කාර්මික නිලධාරීන්ට චක්‍රලේඛනයක් ආවා V වන ශ්‍රේණිය අහෝසි කරලා V(i) සහ V(ii) කරලා. එම චක්‍රලේඛනයේ පැහැදිලිව කියලා තියෙනවා, 94 දී ඒ චක්‍රලේඛනය එනකොට 93 කව්රුහරි V වන ශ්‍රේණියේ සිටියා නම්, එයාව V(ii) ට දාන්නේ නැතිව V(i) ශ්‍රේණියට දානවා කියලා. නමුත් V(i) ශ්‍රේණියට දැම්මේ නැහැ. V(ii) ශ්‍රේණියට දැම්මා. මේ අවස්ථාවේදී සාක්ෂිකරු හඳුනාගත් බඳවා ගැනීමේ පටිපාටියේ 54 වන පිටුව A5 වශයෙන් ලකුණු කරන ලදී. සාක්ෂිකරුට පෙන්වන ලද ලේඛනයක් හඳුනාගෙන 96 ඉඳලා මාව පත්කෙරුවා. නමුත් දුන්නේ 2001 ඉඳලා වගඋත්තරකරු විසින් නිකුත් කරන ලද එම ලේඛනය A6 වශයෙන් ලකුණු කරන ලදී.

ඉල්ලුම්කරු වෙත 2006.05.15 වන දින නිකුත් කරන ලද A7 වශයෙන් ලකුණු කරන ලදී. ඉල්ලුම්කරු වෙත IV වන ශ්‍රේණියේ ඉංජිනේරු තනතුරට අදාළ ලේඛනය A8 වශයෙන් ලකුණු කරන ලදී. මේ අවස්ථාවේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටිය A9 සහ A10 වශයෙන් ලකුණු කරන ලදී. සාක්ෂිකරු A11, A12 වශයෙන් තවත් ලේඛන දෙකක් ඉදිරිපත් කරන ලද අතර A12 ලේඛනයට වගඋත්තරකාර පක්ෂය විරෝධතාවයක් නගන ලදී. පසුව ඔප්පු කිරීමේ භාරයට යටත්ව එකී ලිපිය ලකුණු කරන ලදී. මූලික සාක්ෂිය අවසන් කිරීමෙන් පසුව හරස් ප්‍රශ්න සඳහා 2018.09.13 සහ 2018.10.04 වන දිනට නියම කරන ලදී. හරස් ප්‍රශ්න වලදී ඉල්ලුම්කරු විසින් A4 ලෙස ලකුණු කරන ලද ලේඛනය R2 ලෙසත්, A7 ලෙස ලකුණු කරන ලද ලේඛනය R3 ලෙසත්, A8 දරන ලේඛනය R4 ලෙසත් ලකුණු කරන ලදී.

මේ අවස්ථාවේදී IV වන ශ්‍රේණියට බඳවා ගැනීමේ පටිපාටියේ පිටපතක් R5 ලෙස ද ලකුණු කරන ලදී. හරස් ප්‍රශ්නවලදී ඉල්ලුම්කරු විසින් A10 ලෙස ලකුණු කරන ලේඛනය වගඋත්තරකාර පාර්ශ්වය R6 ලෙස ලකුණු කරන ලදී. හරස් ප්‍රශ්න එදින අවසන් වූ අතර නැවත ප්‍රශ්න සඳහා දින ලබා දෙන ලදී.

2019.06.10 වන දින නැවත ප්‍රශ්න සඳහා ඉල්ලුම්කරු කැඳවන ලදී. A11 ලේඛනය පෙන්වමින් ඉල්ලුම්කරුට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු අයට IV වන ශ්‍රේණියේ ඉංජිනේරු තනතුරු ලබා දුන් බව ප්‍රකාශ කරන ලදී. A1 සිට A12 දක්වා ලේඛන ලකුණු කරමින් ඉල්ලුම්කරුගේ නඩුව අවසන් කරන ලදී. 2019.09.12 වන දින වගඋත්තරකරු වෙනුවෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පාලන කේ. ඒ. පියසිරි මහතා සාක්ෂියට කැඳවන ලදී.

1993.11.12 වන දින ඉල්ලුම්කරු වගඋත්තරකාර ආයතනයට බැඳුණු බවත් විශ්‍රාම යනතුරුම කොන්ත්‍රාත් පදනමක් යටතේ සේවය කළ බවත් ප්‍රකාශ කරන ලදී. අධිකරණයෙන් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් වැඩිදුරටත් කියා සිටියේ ඉල්ලුම්කරු මෙම අධිකාරියට බැඳෙන්න පෙර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවය කරන ලද බවත්, පසුව මාහාමාර්ග දෙපාර්තමේන්තුවේ සේවය කරන ලද බවත් පසුව දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට බැඳුණු බවත් කියා සිටී. විශේෂයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ඉල්ලුම්කරුව අන්තර්ග්‍රහණය කර ඇති බව ප්‍රකාශ කරන ලදී.

2007.03.12 වන දින IV වන ශ්‍රේණියේ ඉංජිනේරු තනතුරක් ලැබුණු බවත්, IV වන ශ්‍රේණියේ සිට III වන ශ්‍රේණිය ලබාගැනීමට ලියුම්කරුට දස වසරක පළපුරුද්දක් අවශ්‍ය බව වැඩිදුරටත් කියා සිටී. ඉල්ලුම්කරු වයස අවුරුදු 60 දී විශ්‍රාම ගිය බව ආර් 7 ලේඛනය මගින් පෙන්නුම් කරයි. වැඩිදුරටත් සාක්ෂි දෙමින් කියා සිටියේ විශ්‍රාම ගොස් වසර අටකට පසුව මෙම නඩුව ඉදිරිපත් කර ඇති බවත් එය සේව්‍ය සේවක සම්බන්ධතාවය කැඩීමට ඉවහල් වන බවත් දක්වමින් මෙම නඩුව විසඳීමට බේරුම්කරණයට බලයක් නොමැති බවට විරෝධතාවයක් දක්වන ලදී. මෙහිදී විරෝධතාවය සම්බන්ධයෙන් කරුණු දැක්වීමට දෙපාර්ශ්වයට අවසර දෙන ලදී. දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද කරුණු සලකා බලා ඉදිරිපත් කර කරුණු නව කරුණු නොවන බැවින් මූලික විරෝධතාවය අවසානයේ දී සළකා බලන බවත් නඩුව දිගටම විභාග කරන ලද බවටත් ප්‍රකාශ කරන ලදී.

2020.07.22 වන දින සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීම අරඹන ලදී. ඉල්ලුම්කරු IV වන ශ්‍රේණියේ ඉංජිනේරු තනතුරට 2007.03.02 වන දින සිට A8 මගින් පත්වීම දුන් බව පිළිගන්නා ලදී. A8 ලිපියේ වසරක පරීක්ෂණ කාලයෙන් පසුව ස්ථිර කරන බවට දැක්වෙන බව  සාක්ෂිකරු පිළිගන්නා ලදී. සාක්ෂිකරු පරස්පර විරෝධී සාක්ෂි දෙන බව එදින නමවෙනි පිටුවේදී පැහැදිලි විය. කෙසේවෙතත් සාක්ෂිකරු සමහර ප්‍රශ්න වලදී තමන් ඒ ගැන පෞද්ගලිකව නොදන්නා බව සඳහන් කිරීම ද සුවිශේෂ කරුණකි. සාක්ෂිකරු ඇතැම් ප්‍රශ්න වලදී පිළිතුරු නොදුන් අතර ඒ පිළිබඳව නොදන්නා බවත් සුවිශේෂිව සඳහන් කර ඇත.

2022.07.28 වන දින වගඋත්තරකාර ආයතනයේ සාමාන්‍යාධිකාරී පුෂ්පා පද්මිණී වික්‍රමසිංහ විතාන මහත්මිය සාක්ෂියට කැඳවන ලදී. ආර් 9 ලිපිය දක්වමින් ඉල්ලුම්කරු 1978 මහාමාර්ග දෙපාර්තමේන්තුවේ උප පරීක්ෂකවරයෙකු වශයෙන් සේවයට බැඳුණු බවත්, ඉල්ලුම්කරු ඉංජිනේරු IV වන ශ්‍රේණියට 2007.03.12 වන දින පත් කර ඇති බවත්, IV වන ශ්‍රේණියේ සිට III වන ශ්‍රේණියට උසස් වීමට සිව් වසරක සතුටු දායක සේවයක් අවශ්‍ය වුවද ඉල්ලුම්කරු හැට සම්පූර්ණ වීම නිසා 2008 විශ්‍රාම ගිය බැවින් එම උසස් වීම ලබාගත නොහැකි බව දන්වමි.

මෙම නඩු විභාගයේ දී වගඋත්තරකරුවන්ගේ ස්ථාරය වූයේ මෙම නඩුව අසා තීරණය කිරීමට බේරුම්කරණයට බලයක් නොමැති බවට විරෝධතා දැක්වීම බැව් ඉතා පැහැදිලිවම පෙනේ.

නිදසුනක් ලෙස නඩු විභාගය අතරමගදී දෙවරක් මූලික විරෝධතාවයක් ඉදිරිපත් කර තිබුණි. දෙපාර්ශ්වය විසින් විමසීම සම්බන්ධයෙන් දීර්ඝ ලෙස ලිඛිත දේශන ඉදිරිපත් කර ඇත. එකී දේශන සලකා බැලීමේදී  බොහෝ දුරට සාක්ෂිමය වලංගුතාවයක් නොමැති සිද්ධිමය කරුණු පුනරුච්චාරණය කරන බැව් පැහැදිලි වේ.

ඉල්ලුම්කරු දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමත බඳවා ගැනීම් පටිපාටියට අනුව කාර්මික නිලධාරී V(i) වන ශ්‍රේණයේ වසර පහක සේවා කාලයෙන් පසුව ඉංජිනේරු IV වන ශ්‍රේණියට උසස් කළ යුතු වේ. ඉංජිනේරු IV වන ශ්‍රේණියේ වසර හතරක සේවා කාලයෙන් පසුව ඉංජිනේරු III වන ශ්‍රේණියට හිමිකම් ලබා දිය යුතු වේ. ඉල්ලුම්කරු 2001 වසරේදී මානව හිමිකම් කොමිෂමට කරන ලද පැමිණිල්ලක් අනුව පරීක්ෂණයේදී වගඋත්තරකරුවන් කියා සිටියේ වරද නිවැරදි කර දෙන බවයි. ඒ අනුව 1999.11.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි V(i) වන ශ්‍රේණියට ලබාදෙන ලදී. අභියාචනයකින් පසුව V(i) වන ශ්‍රේණිය පිහිටුවා හිඟ වැටුප් ලබා දෙන ලදී.

මේ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වය නෛතික විරෝධතාවයක් පාමින් ප්‍රශ්ණය යටපත් කිරීමට උත්සහ කරන බව පැවසිය යුතුය.

### ප්‍රදානය

දෙපාර්ශ්වය විසින්ම ඉදිරිපත් කරන ලද සමස්ථ කරුණු අධ්‍යයන කිරීමේදී මෙන්ම ලකුණු කරන ලද ලේඛන කළකා බැලීමේදී සහ ඉදිරිපත් කරන ලද ලිඛිත සැලකිරීම් කෙරෙහි අවධානය යෙමු කිරීමේදී පැහැදිලි වන්නේ ඉල්ලුම්කරු ක්‍රියාකර ඇති ආකාරය නිවැරදි බවත් වගඋත්තරකාර පාර්ශ්වය බොහෝ අවස්ථාවල දී ඇහුම්කන් නොදීම, නොසලකා හැරීම, ප්‍රතික්‍රියා දැක්වීමට ප්‍රමාද වීම යන හේතු මත මෙන්ම හැකි සෑම අවස්ථාවකදීම විරෝධතාවයන් පෑම වැනි හේතූන් නිසා නඩු කටයුතු අනවශ්‍ය ලෙස දික්ගැස්සුණු බව පැහැදිලි වේ.

මේ කරුණු සියල්ල සැලකිල්ලට ගෙන ඉල්ලුම්කරුගේ ඉල්ලීමට අනුව,

1. 1999.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉංජිනේරු 4 වන ශ්‍රේණිය සහ 2003.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉංජිනේරු තුන්වන ශ්‍රේණිය ලබාදිය යුතුය.

2. ඒ අනුව ඉල්ලුම්කරුට හිඟ වැටුප් ලෙස රු. 2,45,932.50 ගෙවිය යුතුය.

3. බේරුම්කරණ ගාස්තුව වශයෙන් රුපියල් එක්ලක්ෂ විසි පන් දහස (125,000/-) ක මුදලක් ද ප්‍රදානය කළ යුතුය.

මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මසක් ඇතුළත ඉහතින් දක්වූ රු. 370,932.50 (රු. තුන්ලක්ෂ හැත්තෑදහස් නවසිය තිස් දෙකයි සත පනහ) ක මුදල දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගාල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට නියම කරමි.

තව ද ඉල්ලුම්කරුට හිමි වෙනත් ව්‍යවස්ථාපිත දීමනා සම්බන්ධයෙන් ඉල්ලුම්කිරීමට මෙම ප්‍රදානය බාධාවක් නොවේ. පැමිණිලි පක්ෂය විසින් ඉල්ලීමට අදාලව ඉදිරිපත් කරන ලද කරුණු අනුව ඉල්ලුම්කරුගේ ආයාචනය පරිදි මෙම ප්‍රදානයන් ලබාදීම සාධාරණ සහ යුක්ති සහගත වේ.

*සටහන*

මෙම නඩුව වසර හයකට ආසන්න කාලයක් පවත්වා ගෙන යාම සිදුවූයේ වගඋත්තරකාර පාර්ශ්වයේ නිසි පරිදි නඩු කටයුතුවලට සහභාගී නොවීමත් උපදෙස් ලබා ගැනීමට ප්‍රමාද වීමත් හේතුවෙනි. කෙසේ වෙතත් Covid 19 වසංගත කාලය තුල රටේ පැවති අවිනිශ්චිත තත්ත්වය ද එය කෙරෙහි බලපාන්නට විය.

එස්. එම්. එස්. ජයවර්ධන,
බේරුම්කරු.

2023 ඔක්තෝබර් 04 වන දින බේරුම්කරණ අංශයේ දී ය.

EOG 11 - 0033

---

මගේ අංකය: IR/COM/04/2022/96.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.06.27 දිනැති හා අංක 2338/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.06.22 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පල්ලෙවෙල, බෝරුක්ගමුව, අංක 159/4 හි පදිංචි ඩබ්. කේ. අතාවුද ආරච්චි මයා සහ කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, එයාර්ලයින් සෙන්ටර් හි පිහිටි ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A46/2023 හා 2023.09.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ඔක්තෝබර් මස 17 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

ගොනු අංකය: IR/COM/04/2022/96

01. ඩබ්. කේ. අතාවුද ආරච්චි මයා,
159/4,
බෝරුක්ගොමුව,
පල්ලෙවෙල.

*පළමු පාර්ශ්වය*

නඩු අංකය: A/46/2023

02. *ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ්,*
*එයාර්ලයින් සෙන්ටර්,*
*බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල,*
*කටුනායක.*

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් අංක IR/COM/04/2022/96 හා 2023.06.22 දින ලිපියෙන් මා පත්කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවතින කරුණු වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් නීතීඥ බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා ඔහුගේ අංක IR/COM/04/2022/96 හා 2023.05.19 ලිපියේ සඳහන් කර ඇත්තේ ඩබ්. කේ. අතාවුද ආරච්චි මයාට 2020 වර්ෂයට අදාල ප්‍රසාද දීමනාව සඳහා හිමිකමක් තිබේ ද හිමිකමක් තිබේ නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වී තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන පිළිබඳවයි. එම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා වෙත යොමුකර ඇත.

**පෙනී සිටීම**

**පළමු පාර්ශ්වය වෙනුවෙන්,**

- ඉල්ලුම්කරු වන ඩබ්ලිව්. කේ. අතාවුද ආරච්චි මහතා පෙනී සිටී.

***දෙවන පාර්ශ්වය වෙනුවෙන්,***

- නීතීඥ නිකිත සේනාරත්න මහතා,
- එච්. ආර්. සුපවයිසර් කාංචන කන්නන්ගර මහතා,
- මානව සම්පත් විධායක මලිත් ගමගේ මහතා,
- සහකාර කළමණාකරු (මානව සම්පත්) තුෂාර මොරවක මහතා.

නඩු විභාගයන් පැවැත් වූ දිනයන්,

2023.07.07
2023.07.12
2023.07.19
2023.07.27
2023.08.04
2023.08.08
2023.08.24
2023.09.04

2023.07.07 වන දින පළමු පාර්ශ්වය විසින් තම පළමු විස්තර ප්‍රකාශය බේරුම්කරණය වෙත ඉදිරිපත් කර ඇත. දෙවන පාර්ශ්වය එය ඉදිරිපත් කර නොතිබූ අතර 2023.07.19 වන දින එය ඉදිරිපත් කරන ලෙසටත් නොමැති නම් ඒකපාර්ශ්විකව නඩුව ඉදිරියට පවත්වාගෙන යන බව දෙවන පාර්ශ්වයට දැනුම් දී ඇත.
(පිටු අංක 31)

ඉල්ලුම්කරු තම පළමු විස්තර ප්‍රකාශයෙන්, ගරු අධිකරණය වෙත දන්වා ඇත්තේ 2020 වර්ෂයේ දෙසැම්බර් මස 15 වන දිනට ගෙවිය යුතුව තිබූ ප්‍රසාද දීමනාව ඒ මාසයේ නොගෙවා දෙවන පාර්ශ්වය විසින් එම ගෙවීම් ප්‍රමාද කල බවයි. එබැවින් එය ගෙවන ලද්දේ 2021 වර්ෂයේ අප්‍රේල් මස 08 වන දින බවයි. එම වර්ෂයේ ප්‍රසාද දීමනාව වශයෙන් ගෙවන ලද්දේ මාස 04 වැටුපක් නොව මාස 01 ක වැටුපක් බව සඳහන් කර ඇත. මෙම ප්‍රසාද දීමනාව ගෙවීම සඳහා පදනම් කරගත් නිර්ණායකය වන්නේ අදළ මුදල් වශයෙන් සේවයේ යෙදී සිටීම සහ ගෙවීම් කරන දිනය වන දෙසැම්බර් මස 15 වන දින තෙක් සේවයේ යෙදී සිටීමයි. (මෙම ආයතනයේ සාමුහික ගිවිසුම් ප්‍රකාශයේ (CBA) හි 11.1 (a) හා (c) වගන්තිවල සඳහන් කර තිබේ. මා මේ කාරණා දෙකම සම්පූර්ණ කර තිබේ. යනුවෙන් සඳහන් කර තිබේ. (පිටු අංක 10)

එනම් 2020 වර්ෂයේදී දෙසැම්බර් මස ප්‍රසාද දීමනා ගෙවීමට අදාල මුදල් වර්ෂය වන්නේ 2019.04.01 සිට 2020.03.31 දක්වා කාල පරිච්ඡේදයයි. මා එය සම්පූර්ණ කර තිබුණි. අනෙක් කරුණ දෙසැම්බර් 15 තෙක් සේවයේ යෙදී සිටීමයි. මා එම වර්ෂයේ දෙසැම්බර් 15 වන දින ද පසුකර දෙසැම්බර් මස 28 වන දින දක්වා සේවය කරන ලදී. ඒ අනුව දෙවන කරුණද මා විසින් සම්පූර්ණ කර ඇත. (පිටු අංක 41)

නමුත් ආයතනය විසින් ප්‍රසාද දීමනාව ගෙවීම ප්‍රමාද කළ නිසා මෙම මුදල මා හට අහිමි කිරීම සාධාරණ නොවන බව මා හැඟීමයි. (පිටු අංක 10)

දෙවන පාර්ශ්වය සිය පළමු විස්තර ප්‍රකාශය ඉදිරිපත් කරමින් එහි 6 යටතේ සඳහන් කර ඇත්තේ 2019 අප්‍රේල් මස සිදු වූ පාස්කු ප්‍රහාරයත්, 2020 ඇති වූ කොවිඩ් 19 ගෝලීය වසංගතයක් හේතුවෙන් 2019/2020 යොමුව යටතේ පෙර මූල්‍ය වර්ෂය සේවා යෝජකයාගේ මෙහෙයුම් කටයුතු වලට අහිතකර ලෙසට බලපාන ලද අතර, එය පාඩු ලැබූ වර්ෂයක් බවයි. එබැවින් සේවා යෝජකගේ අධ්‍යක්ෂක මණ්ඩලය, එම මුල්‍ය වර්ෂය සඳහා කිසිදු සේවකයෙකුට ලාභාංශ ප්‍රසාද දීමනා නොගෙවීමට තීරණය කළේය යනුවෙනි. (පිටු අංක 34)

2023.08.24 වන දින බේරුම්කරණය සහකාර මානව සම්පත් කළමනාකරු තුෂාර සෞම්‍ය මොරවක මහතාගෙන් අධිකරණය විසින් නගන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්,

ප්‍ර. මොන කාල සීමාවට අදාලවද ප්‍රසාද දීමනාව ගෙව්වේ අවබෝධතා ගිවිසුම අනුව
පි. 2019.04.01 සිට 2020.03.31 දක්වා කාලය සැලකිල්ලට ගෙන
ප්‍ර. කොහොමද ගෙව්වේ, ක්‍රමවේදය කුමක්ද? මාස කීයක වැටුප ද?
පි. මාසයක වැටුප ගෙව්වේ
ප්‍ර. අදාල සේවකයාගේ මාසික වැටුපක් අමතරව ගෙවීම
පි. මේ ප්‍රසාද දීමනාව ගෙවන්නේ එදිනට සේවයේ යෙදී සිටින සක්‍රිය සේවකයන්ට පමණයි. (පිටු අංක 51)

සහකාර කළමනාකරු (මානව සම්පත්) තුෂාර සෞම්‍ය මොරවක මහතා 2023.08.04 වන දින බේරුම්කරණය ප්‍රශ්නකිරීම් වලදී,

ප්‍ර. තමුන් පිළිගන්නවා ද? 2019 මාර්තු සිට ඔහු විශ්‍රාම යාම දක්වා සේවය කළා.
පි. ඔව්.
ප්‍ර. කවද්ද විශ්‍රාම ගියේ ඉල්ලුම්කරු
පි. වසන්ත මහතා විශ්‍රාම ගියේ 2020.12.28 දින
ප්‍ර. ප්‍රසාද දීමනා ඔහුට හිමි නැහැ කියල තමයි ආයතනය කියන්නේ
පි. ආයතනයේ ස්ථාවරය ඒකයි. (පිටු අංකය 52)

**නිරීක්ෂණ හා නිගමන**

ඉල්ලුම්කරු වන ඩබ්. කේ. අතාවුද ආරච්චි මහතා ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ් හි 1990.10.15 වන දින සිට 2020.12.28 දක්වා අවු. 30, මාස 2, දින 13ක් සේවය කර ඇති අතර 2020.12.28 වන දින ඔහු සේවයෙන් විශ්‍රාම ගොස් ඇත. (පිටු අංක 10)

මෙම ආයතනයේ 2016 සාමුහික ගිවිසුම් ප්‍රකාශයේ 11 අනුව ප්‍රසාද දීමනා ගෙවීමට අදාල කොන්දේසි 11.1 11.(a) 11.(b) 11(c) 11.4 අනු ඡේදවලින් පැහැදිලි කර ඇත. (පිටු අංක 10)

මේ අනුව අදාල මුදල් වර්ෂයේ සේවයේ යෙදී සිටීම, එනම් අදාල වර්ෂයේ දෙසැම්බර් මස 15 වන දින තෙක් සේවයේ යෙදී සිටීමයි. තවද මෙම ප්‍රසාද දීමනාව සාමුහික ගිවිසුම් ප්‍රකාශයේ සඳහන් වන්නේ එහි 11.4 පරිදි 1-7 දක්වා සේවකයන්ට පමණක් බවයි. මෙය 12 - 1 වගන්තියෙන් පැහැදිලි කර ඇත. (ඇමුණුම් R 4)

දෙවන පාර්ශ්වය විසින් සිය ලිඛිත දේශනය ඉදිරිපත් කරමින් එහි 5, 6, 7 යටතේ මූලික විරෝධතාවයන් මගින්, කිසිදු සජීවී කාර්මික ආරාවුලක් නොමැති බව සඳහන් කර ඇතත්, ඉල්ලුම්කරු විසින් ප්‍රසාද දීමනා නොලැබීම සම්බන්ධයෙන් මීගමුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට පැමිණිල්ලක් කර බව2023.08.04 වන දින බේරුම්කරණය සඳහන් කර ඇත.

මීගමුවෙන් ආපසු නාරාහේන්පිට මෙහෙවර පියසට දැම්මා එතනදී සමථයකට පත් වුනේ නැති නිසා තමයි බේරුම්කරණය ආවේ. (පිටු අංක 53)

මේ අනුව දෙවන පාර්ශ්වය විසින් දෙපාර්ශ්වය අතර කාර්මික ආරාවුල් නොමැති බවට ලිඛිත දේශනයේ සඳහන් කිරීම සාවද්‍ය බව සඳහන් කරමි. එමෙන්ම ඉල්ලුම්කරු 2020.12.28 වන දින විශ්‍රාම ගොස් ඇති අතර ඉන්පසුව 2019 - 2020 ප්‍රසාද දීමනාව වන මාස 04 මුදල, සානුකම්පිතව සලකා බලා එක් මාසයකට පමණක් ගෙවීමට, 2021.04.07 වන දින ආයතනය අවබෝධතා ගිවිසුමකට එළැඹී ඇති බව පැහැදිලි වේ. (R 1) මෙය සාමුහික ගිවිසුමක් නොවේ. සාමුහික ගිවිසුම වන්නේ ( R 4) ලේඛනයයි. එම සාමුහික ගිවිසුම් ප්‍රකාරව 11 ප්‍රසාද දීමනා යටතේ ඉල්ලුම්කරු 2020.12.28 විශ්‍රාම යාමෙන් පැහැදිලි වන්නේ ඔහු 2020.12.15 දක්වා අදාල මුදල් වර්ෂයේ සේවය කර ඇති බවයි. ඒ අනුව එහි 11.1 ( a) අවශ්‍යතා ඉල්ලුම්කරු සපුරා ඇත.

2019 - 2020 මුදල් වර්ෂයට අදාල බෝනස් මුදල 2020.12.15 දිනට නොගෙවූ අතර එය ගෙවන ලද්දේ 2021 අප්‍රේල් මාසයේදී ය. මෙයින් පෙනී යන්නේ 2020.12.15 වන දින 2019-2020 ප්‍රසාද දීමනා ගෙවනු ලැබුවේ නම් එය අනිවාර්යයෙන්ම ඉල්ලුම්කරුට හිමිවන බවයි. එහෙත් සාමුහික ගිවිසුමේ ගිවිසත් ප්‍රකාර ආර්ථික දුෂ්කරතා නිසා එම ප්‍රසාද දීමනා මුදල මාස 01 දක්වා අඩු කිරීමට එම මුදල 2021 අප්‍රේල් මාසයේ ගෙවීමටත් අවබෝධතා ගිවිසුමක් 2021.04.07 අත්සන් කර ඇත. ඒ වන විට ඉල්ලුම්කරු විශ්‍රාම ගොස් සිටියත්, අදාල තීරණය ගැනීමේ ප්‍රමාදය සිදුකර ඇත්තේ දෙවන පාර්ශ්වය විසින් බවට නිගමනය කරමි.

2020 දෙසැම්බර් මස 15 වන දිනට ගෙවිය යුතු මුදල, ගෙවීම 2021 අප්‍රේල් මස 07 වන දින සිදු වී ඇත. එබැවින් අදාළ මුදල ඉල්ලුම්කරුට නීත්‍යානුකූලව ලැබිය යුතු සහ ඔහු විසින් උපයා ගත් ප්‍රසාද දීමනාවක් බවට නිගමනය කරමි. ඒ අනුව එම මුදලට ලබා දෙන ලෙසට විශේෂයෙන් ඉල්ලීමක් කර නැතැයි දෙවන පාර්ශ්වය අධිකරණය සඳහන් කළත් එසේ ඉල්ලීම් කිරීම අවශ්‍ය නොවන බවට නිගමනය කරමි. මෙම තත්වය ඉල්ලුම්කරු මීගමුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට පැමිණිලි කලවිට, එම මුදල ගෙවීමෙන් සමථයකට පත්වීමේ අවස්ථාව දෙවන පාර්ශ්වයට තිබූ බව නිරීක්ෂණය විය.

මේ අනුව 2016 බලාත්මක සාමුහික ගිවිසුම අනුව, 2019-2020 සඳහා ශ්‍රී ලංකා කේටරින් ලිමිටඩ් ආයතනය විසින් 2021.04.07 දාතමින් ඉල්ලුම්කරුට ගෙවිය යුතු මාසික වැටුප වන රුපියල් එක්ලක්ෂ හතලිස් තුන් දහස් නවසිය අටක මුදල (143,908.00) මුදල ඉල්ලුම්කරු වෙත ගෙවීම යුක්ති සහගත හා සාධාරණ බවට නිගමනය කරමි.

### ප්‍රදානය

ඉහත කාරණා හේතුවෙන් කාර්මික නීතියේ ඉහලින්ම පිලිගැනෙන යුක්ති සහගත හා සාධාරණ නිගමනයක් වශයෙන් මෙම නඩුවේ ඉල්ලුම්කරු වන ඩබ්. කේ. අතාවුද ආරච්චි මහතාටද 2019 - 2020 වර්ෂයට අදාල ප්‍රසාද දීමනාව වන ඔහුගේ එක් මාසයක වැටුප වන රුපියල් එක් ලක්ෂ හතලිස් තුන් දහස් නවසිය අටක මුදල (143,908.00) ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ් ආයතනය විසින් ගෙවිය යුතු බවට මෙයින් නියෝග කරමි. තවද මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මාස දෙකක් ඇතුළත අදාල මුදල මීගමුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කල යුතු බවට ද නියම කරමි. එමෙන්ම මෙම ප්‍රදානය මොහුට පමණක් සීමා වන බවද වැඩිදුරටත් සඳහන් කරමි.

ඒ. බී. හේරත්,
බේරුම්කරු.

2023 සැප්තැම්බර් මස 27 දින,
කම්කරු දෙපාර්තමේන්තුවේ
බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

EOG 11 - 0034

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.